RESIDENTIAL DESIGNS, PLANS & PERMITS

RANJITH WANNINAYAKE
B.Sc(BE),M.Sc(Arch),AIA(SL),Dip Ineterior(NSW)
Registered Building Practitioner DP-AD 43423
Member of the Building Designers Association of Victoria 3862
Chartered Architect (SL) A0476

20years exp.

- FREE ADVICES
- PLANS–SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS
- CORDINATING OTHER CONSULTANTS WORK

REGISTERED Building Practitioner
bdav

3/19 Balmain Court, Lalor 3075
Tel: 0430 066 241 Email: designrake@gmail.com









# අසෙනිය කුසුම

**නිරාෂ ගුණසේකර**



**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තෝරාගනු ලබන කවියක් හොඳද නර-කදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## සඳ දෙසූ වසල සුතුර

**නිදන නෙත නො දකින**
**රැයේ කළු කුණු කිලිට**
**හොඳහැටි ම දන්නේ**
**මේ දුලන සඳ නො වෙද**

**සඳ මතක පොත් ගුලේ**
**තැන තැන වැඩ වසනු ඇති**
**අපේ බුදු හාමුදුරුවරු**
**සඳට හිතෙනව ඇති**
**දෙසන්නට ඒ බණ**
**හඬක් කෝ එනමුත් සඳට !**

**නිහඬ සඳ වඩියි**
**වැව් ළිං සයුරු දිය තල මතට**

**නො සිතා ම අපුලක්**
**ජරාවක්**
**බලන් ඒ සඳ ම**
**දිලෙන'යුරු මෝඩැළේ**
**කුණු කාණුවේ**
**පොල් ලෙලි වළේ**
**ලෙවන් කාරා කෙළ ගසන**

### ගැමුණු පී. දසනායක

('උදුම්බර සිත' කාව්‍ය සංග්‍රහය - 2010 )

ගැමුණු පී. දසනායකගේ 'උදුම්බර සිත' කාව්‍ය සංග්‍රහයේ 'සඳ දෙසූ වසල සුතුර'යි අද තෝරාගත්තේ. මාතෘකාවම කවියකි. බෞද්ධ වසල සූත්‍රය ආශ්‍රයෙන් බණක් දෙසී ඇති බවක් ඉන් කියැවේ. විචිත්‍ර ධර්ම කථිකයා අනෙකෙකු නොව, 'සඳ' බවට ඉංගිත පහළ වේ. එය තරමක කුහුලක් දනවන බැවින්, සීරුවෙන් පද අතර ඇවිද ගොස් ඒ කුහුල මැඩගන්න තැත් දරමු.

රාත්‍රිය යනු දවසාවසානයේ සියළුදෙනාම ඇස් කන් පියාගෙන නින්දට එළැඹෙන අපූරුම සුය-ාමයකි. දිවා කල විඳි සරතැසට යම් විරාමයක් තබා අත්පත් කරගන්න නින්ද තුළ අප ගිලීයන්නේ බාහිර පරිසරය හා එතෙක් තිබුණු සියළුම බැඳීම් අත්හැර දමමිනි. නින්දේ කිමි-දෙන අපට රාත්‍රිය ඉතාමත් සුන්දරව දැනී ගියද, පියැවුණු ඇස් කන් වලින් තවදුරටත් රාත්‍රියේ නියම ස්වරූපය සබුද්ධිකව දැකගත හැකි නොවේ. එය කිසිවිට සුන්දර යැයි සිතූවද සුන්දරම නොවේ. රාත්‍රියටත්, තමනට ආවේණික වූ දහසකුත් කුණු කිළුටු තිබේ. නමුදු නිදිගත් මිනිසුන් දස දහසක් අතරමැද, උනුනට හසු නොවුණු රාත්‍රියේ දහසක් කිලිට මනාව දකින එක් අයෙකු සිටී. අජීවී වස්තුවක් ලෙස අහසේ ලඹ දුන්නද, ඊට ජීවී බවක් ආරෝපණය කරන අප කවියා, මේ මහා අන්ධකාර රාත්‍රියේ, නිදිගත්තවුන් නොදකින අනන්තවූ කුණු කිලිටි සමූහයක් අස 'සඳ' තවත් එක් සාක්ෂිකරුවෙකු කරයි. මන්ද රාත්‍රියට සඳ අවදියෙන් බැවිනි.

අහස මැද්දට වී නොනිදා පොළව දෙස බලා හිඳින සඳ, බෞද්ධ දර්ශනයෙන් මනාව හික්මවනු ලැබූ සද්ගුණවත් සඳක් බව අප කවියාගේ පරිකල්පනය තුළ කියැවේ. සඳ මතක පොත් ගුලේ වැඩවසන්නේ වෙන කවුරුවත් නොව, අපේ බුදුවරුමය. සැබවින්ම ඒ සඳ යනු, උතුම් මානව ගුණාංග වලින් පරිපූර්ණ වූ සමාජයටම ඇරුණු මිනිසකු වැනිය. සැවොම නිදිගත් යාමයක, කුණු කිලිටි මැනවින් විනිවිදින, එනම් මිනිස් ඇස් වසා සිදුවන බොහෝ අකටයුතුකම් හා නොපනත්කම් පිළිබඳ සවිඥානික වූ පරමාදර්ශී චරිතයක් බඳුය. මතක පොත් ගුලේ වැඩ වසන්නේ බුදුවරුන් නම්, සඳ යනු ධර්ම ඥානයේ කෝෂ්ඨාගාරයක් විය යුතුය. ඉදින්, ඉන් බණ පදයක් දෙකක් කීම කිසි විටෙක අවැඩක් වේ යැයි කාට නම් කිව හැකිද. නමුත් අප කවියා ගේ දැවෙන ප්‍රශ්නය, සඳට හඬක් නොතිබීමයි. බණ කීමට නම් හඬ අවැසිය. නමුදු මේ, හඬ පසෙක ලා පුළු-පුළුවන් තරමට වැඩ කළ යුතු කාලයයි. ක්‍රියාවෙන් යමක් නිදර්ශනය කළ යුතු කාලයයි.

දහසක් බණ පද හිත තෙරපුණද, හඬ අමතක කොට ක්‍රියාවෙන් යමක් කියන්නට සඳ වෑයම් කරයි. අනතුරුව හීන් සීරුවේ ඇවිත් වැව්, ළිං සයුරු දිය තලා මත තම ප්‍රතිබිම්බය තබයි. එය වනාහී රාත්‍රියකම පමණක් විඳිය හැකි ඉතා මනරම් චිත්‍රයකි. අහසේ වළාකුළු අතර පිරී දිලිහෙන හඳම, මහ පොළවේ දිය රැළිති මත නටන කොට කොතරම් සුන්දරද?

නමුදු ඉන් අනතුරුව, අප කවියා අපට පෙන්වන තවත් පැතිකඩක් ඇත. සඳ එලෙස පොළවට වඩින්නේ පිරිසිඳු පැහැදිලි වැව්, සයුරු, ගං හෝ පොකුණු ළිං දිය මතට පමණක් නොවේ යන්නයි. අප මුලින් කියූ දහසක් නිදි ගත්තවුන් නොදකින, රැයේ කුණු කිලිට දරාගෙන හිඳිනා විවිධ තරාතිරමේ දිය පෘෂ්ඨයන් මතටද හඳ වඩී. අනතුරුව, ලෙවන් කාරා කෙළ ගසන, දහ ජරාවෙන් පිරුණ පොල් ලෙලි වළේ, කුණු කාණුවේ, මෝඩ ඇළේ ඇතුළු තවත් බොහෝ වසංගත බහුල දිය ගොහොරු මතට අකැප නොවුණු සඳ පිළිබිඹුව, කිසිදු අපුලකින් තොරව රටාවන් අඳින බවයි.

එදා ගෞතම බුදු රදුන් සැවැත් නුවර වැඩ වසන සමයේ, අග්ගික භාරද්වාජ බ්‍රහ්මණයා උදෙසා දෙසූ වසල සූත්‍රය අද දෙසන්නේ සඳයි. හඬ පමණක් ඉදිරියට ගෙන, ලෝකයක් රවටන, දහසකුත් අකටයුතුකම් කරන වසලයන් අතර, හඬ පසෙක ලා, යහ ක්‍රියාවෙන්ම පමණක් තම උත්තරීතර බව අපට දැනෙන්නට හරින සඳ යනු සැබෑම බ්‍රාහ්මණයකු නො-වන්නේ යැයි කිව හැකිද? මහ රැයේ හුදකලාවම දැල්වුණු සඳක් පල් වතුර වළටත්, සුපිරිසිඳු දිය තලාවටත් සමානාත්මතාවය දැක්වීමෙන් දෙසන ඒ නිහඬ බණ පද, නින්දේ පතුලටත් යටින් නිදි වැද සිටින අපි කවදා අවබෝධ කරගමුද?

නිරාෂ ගුණසේකර